Bogamuwa, Chandrasiri
Drama & Theatre and Image Arts Unit, Department of Fine Arts

*Paper: Diversity*

# ටෙලි නාට්‍ය තිර රචනයේ සාර්ථකත්වයට අධ්‍යයනය හා පර්යේෂණ බලපාන ආකාරය


ලංකාවේ රූපවාහිනී නාලිකා පහකින් සතියේ දින පහ තුළ ටෙලි නාට්‍ය 18ක් ද, සති අන්තයේ ටෙලි නාට්‍ය 16ක් ද වශයෙන් සතියේ දින හතට සිංහල ප්‍රසාංගික අළුත් ටෙලි නාට්‍ය 34ක්, ප.ව. 7.00 සිට 10.00 දක්වා විකාශනය වේ.[1] මීට අමතරව කලින් පෙන්වූ ටෙලි නාට්‍ය දිවා කාලයේ නැවත විකාශනය වේ. මෙකී ටෙලි නාට්‍ය බහුතරයක් අසාර්ථක නිර්මාණ බව විචාරක හා ප්‍රබුද්ධ ප්‍රේක්ෂක මතයයි.

යශෝරාවය, කඩුල්ල, දඬුබස්නාමානය, ඉසිවර අසපුව, දුන්හිඳ අද්දර, හද විල සක්මන, සඳ අමාවකයි, කටු ඉඹුල, රළ බිඳෙන තැන, වසන්ත කුසලානය, ඇබැර්තු ඇත, පසුගිය වසර 29 ක ලංකාවේ රූපවාහිනී ඉතිහාසය තුළ සාර්ථක වූ ටෙලි නාට්‍ය කීපයකි. සාර්ථක ටෙලි නාට්‍ය යනුවෙන් මෙහි දී අදහස් කරන්නේ අර්ථ හා රස සම්පාදනය අතින් පොහොසත්, විචාර අවධානය දිනාගත්, ඇගැයීම් මණ්ඩලයකින් නිර්දේශ වී සම්මානයට පාත්‍ර වූ, ප්‍රබුද්ධ ප්‍රේක්ෂක කතිකාවට ලක් වූ ටෙලි නාට්‍ය වේ. ඉහත කී ටෙලි නාට්‍යවල සාර්ථකත්වයට තිර රචනය ප්‍රබල හේතුවක් විය.

ටෙලි නාට්‍යයක සාර්ථකත්වයට තිර රචනය තීරණාත්මක සාධකයක් වන්නේ නම් තිර රචනයක සාර්ථකත්වය ඇති වන්නේ කෙසේද? ආදර්ශමත් කතාවක් රසවත්ව කීමෙන් ද? කතා වස්තුවට පාදක වන සමාජ පසුබිම හා ජීවන අත්දැකීම් ද? මිනිස් ගති ලක්ෂණ විදහාපාන අව්‍යාජ චරිත නිරූපණය ද? චරිතාන්තර ගැටුම්කාරී අවස්ථා නාට්‍යෝචිතව ඉදිරිපත් කිරීම ද? මෙකී සියලු කාරණා තිර රචනයක සාර්ථකත්වයට ඉවහල්වන බව නිසැකය. එහෙත් ඒ සියල්ල සඵල වන්නේ නිසි අධ්‍යයනයකින් හා පර්යේෂණයකින් පසුව තිර රචනය ලියන්නේ නම් පමණි.

සුප්‍රකට තිර රචක සිඩ් ෆීල්ඩ් මෙසේ පවසයි: "තිර රචනයට තෝරා ගන්නා ප්‍රස්තුතය නිරතුරුව පර්යේෂණය කරන්න. එවිට වස්තු විෂය වඩාත් විස්තෘත වෙයි. තවත් තොරතුරු ලැබෙයි. වස්තු විෂය වඩාත් සමීප වෙයි. ලියන්නේ කුමක්ද යන්න තමන්ටම අවබෝධකර ගැනීම තිර රචනා කලාවේ දුෂ්කරම කර්තව්‍යයයි.[2] සිඩ් ෆීල්ඩ් අවධාරණය කරන්නේ අධ්‍යයනය හා පර්යේෂණය නොකොට ලිවීමේ දී රචනය අසාර්ථක වන බවයි. මෙකී කාරණයේ සත්‍යතාව අද අප නරඹන බොහෝ ටෙලි නාට්‍යවලින් සනාථ වේ. ටෙලි නාට්‍ය වැඩි සංඛ්‍යාවක් අසාර්ථක වී ඇත්තේ අධ්‍යයනයකින් හෝ පර්යේෂණයකින් තොරව ලියූ තිර රචනා නිසාය.

රචකයා කුමන වස්තු බීජ, රචනා රීති හා ශිල්පීය ක්‍රම භාවිතයට ගත්ත දත ටෙලි නාට්‍ය තිර රචනා සාර්ථක වී ඇත්තේ අධ්‍යයන හා පර්යේෂණ සිදුකොට තේමාව කුළු ගැන්වෙන පරිදි ලියූ කල්හි පමණක් බව, අප විසින් නරඹා ඇති පන්සියයකට අධික ටෙලි නාට්‍ය නිරීක්ෂණය කිරීමේ දී ප්‍රත්‍යක්ෂ වූ කාරණයකි.


**ප්‍රමුඛ පද: ටෙලි නාට්‍ය, තිර රචනය, සාර්ථකත්වය, අධ්‍යයනය හා පර්යේෂණ**